*සැ. යු.*- 2011.07.15 දින පළ වූ අංක 1,715 දරන *ගැසට් පත්‍රයේ* I-III, II සහ IV (අ) කොටස් පළ නොවිය.

මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,716 - 2011 ජූලි මස 22 වැනි සිකුරාදා - 2011.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1020 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* — රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

කාර්මික ආරවුල් (සංශෝධන පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1019- B 80244— 7,100 (2011/07)
F1-(S/E)

# පළාත් සභා නිවේදන

## උතුරු මැද පළාත් සභාව

### උතුරු මැද පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ නීති හා රෙගුලාසි

1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාතේ පළාත් අංක 1577-2008 නොවැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස - පළාත් සභා නියෝග යටතේ 5 වැනි උපලේඛනයේ 01 වගන්තිය වන බස් රථ මාසික ධාවන සේවා අවසර පත්‍ර මිල ගණන් සංශෝධන යටතේ (4) (5) (6) ගරු අධ්‍යක්ෂ මණ්ඩල සම්මත කරනු ලැබූ සංශෝධන කිරීම් හා නව ඇතුළත් කිරීම් සියලු දෙනාගේ දැන ගැනීම සඳහා පළ කරමි.

උපාලි අනුරාධ දිසානායක,
සභාපති,
මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය.

**ඇමුණුම 01 - වගන්තිය**

***බස් රථ මාසික ධාවන සේවා අවසරපත්‍ර මිල ගණන් සංශෝධනය කිරීම***

| *කාරණය* | *සංශෝධිත ගාස්තුව රු. ශත.* |
|---|---|
| 4. අන්තර් පළාත් ලොග්පත්‍ර (මාසික) | 1,500.00 |
| 5. අන්තර් පළාත් පිවිසුම් (මාසික) | 1,500.00 |
| 6. අතුරු ගමන්වාර (මාසික) | 2,000.00 |

**ඇමුණුම 02 - නව ඇතුළත් කිරීම්**

*විස්තරය.—*

01. මෙතෙක් අයකළ පොදු බලපත්‍ර ගාස්තුව වෙනුවට ආසන සංඛ්‍යාව අනුව වාර්ෂිකව ආසනයකට රු. 100 බැගින් බලපත්‍ර ගාස්තු අය කිරීම.
02. නව බලපත්‍ර ලබා ගැනීමේ දී එක් බලපත්‍රයක් සඳහා රු. 10,000ක ඇප තැම්පතුවක් කිරීම.
03. බලපත්‍ර සංශෝධන ගාස්තුව ලෙස රු. 25,000 අය කිරීම.

07-590

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.